# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | නර්තනය | 8.1 ඒකකය |
|---|---|---|

කාලය : පැය 01

## නර්තන කලාව හැදෑරීමේ වටිනාකම අගයමු.

- **වරහනේ ඇති පද අතුරින් වාක්‍යවල හිස්තැන්වලට සුදුසු පද තෝරන්න.**

(යහපැවැත්ම, සාරධර්ම, ශාන්තිකර්ම, නර්තනය, කලාවට, ලය තුනට, රස වින්දන, බෙරයට, ඉන්ද්‍රිය, අවසානයේ)

01. ප්‍රායෝගික ව නර්තනය හැදෑරීමෙන් ................................... සමායෝජනයක් සිදුවේ.

02. යහපත් දිවි පෙවෙතකට ඉවහල් වන ක්‍රියාශීලී බව ඇති කිරීමට ................................... ඉවහල් වේ.

03. කලාකෘති නැරඹීමෙන් හා ඒවායෙහි යෙදීමෙන් ................................... ශක්තිය වර්ධනය වේ.

04. නර්තනය මගින් ඇති කරන මානසික උත්තේජනය ජීවිතයේ ................................... කෙරෙහි නිතැතින්ම බලපානු ඇත.

05. ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලදී ................................... නැටීම සම්ප්‍රදාය යි.

06. නර්තනය හැදෑරීමෙන් සංස්කෘතික ................................... අගයන ගුණගරුක පුද්ගලයෙකු බිහිවෙතැයි කීම නිවැරදිය.

07. නර්තන ආරම්භයේ හා ................................... ගුරුවරයාගේ පාද නමස්කාර කිරීම සිදු කෙරේ.

08. ................................... නමස්කාර කිරීම නර්තනය කිරීමට ප්‍රථම සිදු කරන්නකි.

09. ...................................අවස්ථාවන්හි දී වැඩිහිටියාගේ සිට බාලයා තෙක් රංගභූමියට පිවිසීම සම්ප්‍රදාය යි.

10. ................................... අධිපති ලෙස සරස්වතී දේවිය පුද දෙති.

(ලකුණු 2 × 10 = 20)

- **කෙටි පිළිතුරු සපයන්න.**

01. නර්තනය හැදෑරීම මගින් ඇතිවන ගුණාංග 5ක් ලියන්න.

02. ප්‍රායෝගික නර්තනයන් ඉදිරිපත් කිරීමේදී නර්තනය කරනු ලබන ලය ප්‍රභේද කීයක් තිබේද?

03. පාසල් විෂයය මාලාව තුළ අනෙකුත් සෞන්දර්ය විෂයයන් හා සසඳන කල කුසලතා ඔප් නැංවීමට නර්තනයෙන් මනා පිටුවහලක් ලැබේ. එවැනි අවස්ථා 5ක් ලියන්න.

(ලකුණු 10 × 3 = 30)

*සැකසුම : අමිලා ජීවනී*